ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2016 අප්‍රේල් 22

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 මාර්තු

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 මාර්තු මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 110.0 ලෙස ගණනය කර ඇත. මාර්තු මාසයේ දර්ශකය පෙබරවාරි මාසයේ දර්ශකය (110.8) හා සංසන්දනය කල විට 0.8ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 0.72ක අඩුවීමක් වාර්තා කරයි. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.73% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.07% කින් වැඩිවීම බලපා ඇත.

2016 පෙබරවාරි මාසය හා සසඳන කල 2016 මාර්තු මාසය සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනසෙහි 0.73%ක අඩුවීමක් දක්නට ඇත. මෙම අඩුවීම සඳහා එළවළු (0.47%), සහල් (0.39%), අමු මිරිස් (0.09%), පොල් (0.03%), රතු ළූණු (0.03%), කෙසෙල් (0.03%) සහ සියඹලා (0.02%) යන ආහාර ද්‍රව්‍යවල වටිනාකමේ වෙනසෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් ලොකු ළූණු (0.08%), වියළි හාල්මැස්සන් (0.03%), අළුත් මාළු (0.03%), පාන් (0.03%) සහ මිරිස් කුඩු (0.02%) යන ආහාර ද්‍රව්‍යවල වටිනාකමේ වෙනසෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

2016 පෙබරවාරි මාසය හා සසඳන කල 2016 මාර්තු මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනසෙහි 0.07%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ආපනශාලා හා හෝටල්'සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවල ඉතා සුළු වෙනස්වීමක් වාර්තා වී ඇත. 'සෞඛ්‍ය', 'ප්‍රවාහන', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' කාණ්ඩවල වෙනස්වීමක් සිදුවී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 මාර්තු මාසය සඳහා වාර්ෂික උද්ධමනය 2.2% ලෙස ගණනය කොට ඇති බවත්, පසුගිය පෙබරවාරි මාසය සඳහා එම අගය 1.7% ක් ලෙස වාර්තා වූ බවත් තවදුරටත් ප්‍රකාශ කලේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) 2015 ඔක්තෝම්බර් මස සිට අදාල ලිත් මාසය අවසන් වී 21 වන දින ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථන අංක: 011-2147001 / 011-2147020